


# නිදහස් මාධ්‍ය

නිදහස් නිවහල් දේශයක් උදෙසා


ගවේෂණාත්මක
පැහැදිලිව
සංවේදීබව
පෙළගැස්ම
වෘත්තීය
අයිතීන්
නියාමනය
පෙරළිකාරීත්වය
ප්‍රේක්ෂක විශ්වසනීයත්වය
ආචාරධර්ම
ආකල්ප
මර්දනය
හෘද සාක්ෂිය
සමබරව
වාරණය
මූලාශ්‍රවල රහස්‍යභාවය
වාරණය
ආයතන ප්‍රධානීන්
ප්‍රතිපත්ති
නිර්මාණාත්මකබව
අභියෝග
සමාජ ආකල්ප
ජයගැනීම
මාධ්‍ය
භාෂණයේ නිදහස
තර්ජන
ජාත්‍යන්තර සම්මුතීන්
සත්‍යය සහ අවබෝධය
කුතුහලය
තහනම
අතික්‍රමණය
මහජන මතය
අවධානය
තොරතුරු

© රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ISBN 978-955-9073-20-8

ප්‍රධාන සංස්කාරක
**මහාචාර්ය ආරියරත්න ඇතුගල**

සංස්කරණය
**මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ**

නිර්මාණ සැලසුම
**අනුහස් මහවලගේ**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

2013 මැයි 03 දිනට යෙදෙන
ලෝක නිදහස් මාධ්‍ය දිනය සැමරුමේ
විසි වැනි සංවත්සරය වෙනුවෙන් ද,
කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයට
හතළිස් වසරක් පිරීම හා
දෙසතිය සඟරාවට තිස්පස් වසරක් පිරීම ද සමරමින්
ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන්
‘2010 ජාතික ජනමාධ්‍ය සමුළුවේ දී’ පිහිටුවා ගත්
විශ්වවිද්‍යාල ජනසන්නිවේදනය පිළිබඳ
ආචාර්යවරුන්ගේ සංගමයේ ශාස්ත්‍රීය දායකත්වයෙන්
මෙම කෘතිය එළිදැක් වේ.

–



**සමන්තිකා ප්‍රියදර්ශනී**
**කථිකාචාර්ය**
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# සිනමාව හා වාරණය
## 1980 දශකයට විශේෂිතව

**හැඳින්වීම**

සිනමාව කලා මාධ්‍යයකි. එය සැබෑ ලෝකයේ ස්වභාවය ප්‍රශ්න කරමින්, අර්ථ නිරූපණය කරමින් හා සංස්කරණය කරමින් විවිධ නිර්මාණශීලී හා පර්යේෂණාත්මක මං ඔස්සේ ඉදිරිපත් වන්නකි. එසේ ම චිත්‍රපටය හුදු යාන්ත්‍රික ක්‍රියාවලියක් නොව එය අධ්‍යක්ෂකවරයාගේ සුකුමාර සූක්ෂමතාව පදනම් කොටගෙන විශේෂ වූ ප්‍රතිඵලයන් අපේක්ෂාවෙන් සිදු කරන ඡායාරූපාත්මක වරණයක් බවත්, චිත්‍රපටයේ පිළිබිඹු ව ඉදිරිපත් කිරීමේ දී එහි හැඩ නිත්‍යතාව පිළිබඳ හැඟීමෙන් යුතු ව අපේ ලෝකයේ සිදු වන කුතුහල ජනක විශේෂ වූ ස්වභාව සහ ප්‍රහර්ෂය ඇති කරවන දේ චිත්‍රපටය මගින් විශ්වසනීය ආකාරයට ඉදිරිපත් කරන බවත් චිත්‍රපටය පිළිබඳ සිංහල විශ්ව කෝෂයේ සඳහන් වේ. සිනමා නිර්මාණයක් තුළ ඇති විශේෂත්වය වන්නේ ජීවිතයෙහි සිදු වන ඇසිය හැකි, දැකිය හැකි, මෙසේ වේ යැයි සිතිය හැකි, ඕනෑම දෙයක් රූපයක් බවට පත්කොට එය කාලය හා අවකාශය පදනම් කොට ඉදිරිපත් කිරීමට ඇති විශේෂ හැකියාව යි. එසේ ම චිත්‍රපටයේ අත්දැකීම කෘත්‍රිම වුවත් යථාර්ථවාදී හැඟීමක් චිත්‍රපටය තුළින් ප්‍රේක්ෂක මනසෙහි ඇති කරයි. චිත්‍රපටයේ යථාර්ථය කොටස් තුනක් යටතේ දැක්විය හැක. එනම්, චිත්‍රපටය මගින් යථාර්ථය හෙළිදරව් කිරීම, යථාර්ථය අනුකරණය කිරීම හා යථාර්ථය ප්‍රශ්න කිරීම වශයෙනි.

අඳුරු කළ ශාලාවක රිදී පැහැයෙන් බබළන පුළුල් තිරයක් මතට පතිත වන දැවැන්ත සෙවනැළි ඔස්සේ මැවෙන යථාර්ථය මායාමය අරුතකින් ප්‍රේක්ෂක සිත් තුළට සමීප කිරීමේ සුවිශේෂ හැකියාව සිනමා මාධ්‍ය සතු ය.

පොදුවේ ගත් කළ වාරණය (Censorship) යනු දෝෂ පරීක්ෂාව යි. සාහිත්‍ය කලාව ඇතුළු යම් සන්නිවේදන මාධ්‍යයක දෝෂ නැතහොත් යෝග්‍යතාව පරීක්ෂා කර නොගැලපෙන දෑ ඇතොත් ඒවා ඉවත් කොට අනුමත කිරීම මින් අදහස් කෙරේ. එහි වචනාර්ථය 'වැළැකීම', 'වැළැක්වීම,' 'තහනම', 'මුවාව' හෝ 'බාධක' ලෙස ගත හැකි බව සරසවි ශබ්දකෝෂයේ දක්වා ඇත. වාරණය යනු පොදු යහපතට නුසුදුසු ය, පොදු යහපතට අහිතකර ය යන පදනම මත කතා කිරීම හෝ ලිවීම තහනම් කිරීම හෝ යටපත් කිරීම යි.

සිනමාව කර්මාන්තයක් වන බැවින් තම නිෂ්පාදන ස්වයං වාරණයකට ලක් කර ගන්නා වර්ගීකරණ සහතික නිකුත් කිරීම මගින් එම චිත්‍රපට සුදුසු කිනම් කණ්ඩායමකට ද යන්න තෝරා දෙනු ලැබේ. මෙම වර්ගීකරණය බාලවයස්කරුවන් ආරක්ෂා කිරීම සඳහා සහ ප්‍රේක්ෂකයන්ට සිනමා කෘතියේ අන්තර්ගතය දැනුම් දීමට යොදා ගන්නා ක්‍රමයක් ලෙස පමණක් සමහර රටවල ක්‍රියාත්මක වේ.

සාමාන්‍යයෙන් චිත්‍රපටයක් වාරණය ප්‍රධාන ක්ෂේත්‍ර තුනකට අදාළ ව ක්‍රියාත්මක කෙරේ. එනම්, ලිංගිකත්වය, ප්‍රචණ්ඩත්වය හා දේශපාලනය යි. මෙහි ලිංගිකත්වය හා ප්‍රචණ්ඩත්වය ප්‍රධාන වශයෙන් බාලවයස්කරුවන් වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම්වල මූලික අවශ්‍යතාවක් වන අතර, දේශපාලනය යන සාධකය රාජ්‍ය, රාජ්‍ය ආයතන සහ ආණ්ඩුවල අවශ්‍යතාවකි. සමහර රටවල චිත්‍රපට වාරණය ව්‍යවස්ථානුකූල ව නීති විරෝධී වන නමුත් වාරණය තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. සමාජයක් පිළිගන්නා සදාචාර ප්‍රමිතීන්වල මට්ටම නිරූපණය කිරීම හා ආරක්ෂා කිරීම වාරණය මගින් සිදු වේ යැයි වාරණයට පක්ෂ ව අදහස් දක්වන්නෝ පවසති. එමෙන් ම වාරණයට විරුද්ධ ව අදහස් දක්වන්නෝ ප්‍රකාශ කරන්නේ වාරණය මගින් සදාචාරය නිරූපණය වෙනුවට සදාචාර සම්මතයන් ගොඩනැඟීම සිදු කරන බව යි.

ලංකාව තුළ ද ජාතික හා ජාත්‍යන්තර නිර්ණායක අනුගමනය කරමින් සම්මත කරගත් ප්‍රතිපත්ති මාලාවකට අනුව ක්‍රියා කරනු ලබන ප්‍රසිද්ධ රැඟුම් පාලක පනත මානව ප්‍රගතියට හා කලාව රසවිඳීම සඳහා ප්‍රේක්ෂකයාට ඇති අයිතිය හා නිදහස් අදහස් ප්‍රකාශනයට ඇති අයිතිය වැරදි ආකාරයට පාවිච්චි කරන්නේ ද යන්න පිළිබඳ ව විමර්ශනය කරමින් චිත්‍රපට සඳහා වර්ගීකරණ සහතික නිකුත් කරන නෛතික ආයතනය යි. සමාජ වගකීම් මුල් තැනෙහි ලා සැලකිල්ලට ගෙන සමාජයට අහිතකර දේ බැහැර කිරීම රැඟුම් පාලක මණ්ඩලයේ ප්‍රකාශිත ප්‍රතිපත්තිය යි. යම් ආනයනික චිත්‍රපටයක් හෝ දේශීය වශයෙන් නිෂ්පාදනය වන චිත්‍රපටයක් මහජන ප්‍රදර්ශනයට පෙර රැඟුම් පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීම හා එහි නිර්දේශය ලබා ගැනීම අනිවාර්ය වේ.

ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය සිනමා කර්මාන්තයට මෙන් ම මහජනතාවට වග කියනු ලැබේ. රැඟුම් පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ අභිමතයට අනුව අදාළ චිත්‍රපටය 'තහනම් කිරීම' (Banned), 'වැඩිහිටියන්ට පමණයි' (X), 'වැඩිහිටියන්ට වඩාත් සුදුසු යි' (A) හෝ 'අසීමිත මහජන ප්‍රදර්ශනයට සුදුසු'(U) ආදී වශයෙන් වර්ගීකරණ සහතික ඉදිරිත් කරයි.

චිත්‍රපටයක අන්තර්ගතය මගින් රටක ජාතික ආරක්ෂාව (National Security), මහජන ආරක්ෂාව (Public Safety) හෝ මහජන සදාචාරය (Public Morals) තර්ජනයට ලක් වී ඇති බව විශ්වාස කරන විට එයට වාරණයක් පැනවිය හැකි ය. 'දේශපාලනමය වාරණය' (Political Censorship) එනම්, ඒකාධිපති පාලනයන් හි දී බහුලව සිදු වේ. ආගමික පසුබිමක් තුළින් ද චිත්‍රපටයකට වාරණයන් පැනවිය හැකි ය. මෙය බොහෝවිට අදාළ ආගමික කණ්ඩායමේ සාමාජිකත්වයට සීමා විය හැකි අතර ඔවුන් ප්‍රමාණවත් ලෙස බලවත් වූ විට මුළු ජන කණ්ඩායම හෝ සමස්ත රාජ්‍යය දක්වා ම මෙම වාරණය පැතිරිය හැක.

## 1980 දශකයේ සිනමාව

1980 දශකය ලංකාවේ සිනමා කර්මාන්තයේ තීරණාත්මක දශකයක් ලෙස බොහෝ අංශවලින් දැකිය හැකි ය. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හමුවේ පුළුල් වූ වෙළෙඳ පොළ තත්ත්වය හා රූපවාහිනී කර්මාන්තය ප්‍රතිෂ්ඨාපනය වීම සිදු විය. 1983 ජාතිවාදී කළු ජූලිය හේතුකොට අග්නිදිග ආසියාවේ හොඳ ම චිත්‍රාගාරය ලෙස සැලකූ හැඳල විජය චිත්‍රාගාරය සහමුලින් ම

ගිනිගෙන දැවිණි. එහි තිබූ ලාංකික චිත්‍රපට විශාල ප්‍රමාණයක පිටපත් විනාශ විය. කොළඹ ගාමිණී, සැෆයර්, දෙහිවල ට්‍රියෝ, මීගමුවේ - රාජ්, කිරුළපන - කල්පනා ඇතුළු සිනමා ශාලා 12ක් මුළුමනින් ම විනාශ විය. කොළඹ - රියෝ, නවා ඇතුළු සිනමා ශාලා 05කට සාමාන්‍ය අලාභහානි සිදු විය. කේ. වෙන්කට් වැනි චිත්‍රපට අධ්‍යක්‍ෂවරු ජාතිවාදීන්ගේ ඝාතනයට ලක් විය. චිත්‍රපට ප්‍රදර්ශනය බිඳ වැටෙද්දී චිත්‍රපට සංස්ථාව මැදිහත් වී තත්ත්වය පාලනය කිරීමට උත්සාහ කළ ද 89 රටේ ඇති වූ කැරළිකාරී තත්ත්වය හා උතුරු නැගෙනහිර යුදමය වාතාවරණය සිනමා කර්මාන්තය වෙත කරන ලද බලපෑම ප්‍රබල විය. චිත්‍රපට බෙදාහැරීමේ ගැටලු, විදේශීය චිත්‍රපට සීමාවකින් තොර ව මෙරටට ගෙන ඒම හා කලබලකාරී වාතාවරණය තුළ ගෘහ ආශ්‍රිතව රැඳී සිටීමට සිදු වූ වාතාවරණය තුළ රූපවාහිනිය වෙත ආකර්ෂණය වූ ප්‍රේක්ෂක පිරිසක් බිහිවීම ආදී කරුණු මෙයට නිදසුන් ය. මේ තත්ත්වය යටතේ වුව ද සිනමාත්මක වශයෙන් අගය කළ හැකි චිත්‍රපට බිහිවිය.

| | | | |
|---|---|---|---|
| 1980 | - | උතුමාණෙනි | (ගාමිණී ෆොන්සේකා) |
| | - | දඬු මොණර | (විජය ධර්ම ශ්‍රී) |
| | - | පාර දිගේ | (ධර්මසේන පතිරාජ) |
| | - | කරුමක්කාරයෝ | (තිස්ස අබේසේකර) |
| | - | සිරිබෝ අයියා | (සුනිල් ආරියරත්න) |
| | - | හංස විලක් | (ධර්මසිරි බණ්ඩාරනායක) |
| 1981 | - | සොල්දාදු උන්නැහේ | (ධර්මසේන පතිරාජ) |
| | - | සාගරයක් මැද | (ගාමිණී ෆොන්සේකා) |
| | - | බැද්දේගම | (ලෙස්ටර් ජේම්ස් පීරිස්) |
| 1982 | - | මහගෙදර | (තිස්ස අබේසේකර) |
| | - | මලට නොඑන බඹරු | (ෂෙල්ටන් පයාගල/ චන්ද්‍රරත්න මාපිටිගම) |
| 1983 | - | කලියුගය | (ලෙස්ටර් ජේම්ස් පීරිස්) |
| | - | දඩයම | (වසන්ත ඔබේසේකර) |
| | | තුන්වෙනි යාමය | (ධර්මසිරි බණ්ඩාරනායක) |
| 1985 | - | සුද්දිලාගේ කතාව | (ධර්මසිරි බණ්ඩාරනායක) |
| | - | යුගාන්තය | (ලෙස්ටර් ජේම්ස් පීරිස්) |
| 1986 | - | අරුණට පෙර | (අමරනාත් ජයතිලක) |
| | - | දෙවැනි ගමන | (එච්. ඩී. ප්‍රේමරත්න) |

| | | | |
|---|---|---|---|
| | - | මල්දෙනියේ සිමියොන් | (ඩී.බී. නිහාල්සිංහ) |
| | - | කොටි වලිගය | (ගාමිණී ෆොන්සේකා) |
| 1987 | - | විරාගය | (තිස්ස අබේසේකර) |
| 1988 | - | සාගර ජලය මදි හැඬුවා ඔබ හන්දා | (සුමිත්‍රා පීරිස්) |
| 1989 | - | කැඩපතක ඡායා | (වසන්ත ඔබේසේකර) |
| | - | සිරිමැදුර | (පරාක්‍රම නිරිඇල්ල) |

## 1980 දශකයේ සිනමාව හා වාරණය

චිත්‍රපටයක් වාරණය කිරීමේ බලය ඇති නෛතික ආයතනය ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය යි. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ බොහෝ තීරණ හා ප්‍රතිපත්ති එහි සභාපතිවරුන්ගේ අදහස් හා ආකල්ප මත පදනම් වූ බවක් එහි ඉතිහාසය දෙස බැලීමේ දී පෙනේ. 80 දශකයේ රැඟුම් පාලක මණ්ඩල සභාපති ලෙස කටයුතු කළේ ඩී. එච්. අබේසිංහ (1977 - 1989) හා ආර්. පල්ලෙවෙල යි (1989න් පසු). ඩී. එච්. අබේසිංහ සේවය කරන කාලය තුළ දී හත් දෙනකුගෙන් යුත් ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසින් විසිපහ දක්වා ඉහළ දමා ඇත. ජනාධිපතිවරු දෙදෙනෙකු යටතේ සිව් වරක් සේවා දිගුවක් ලබා වසර 12ක දීර්ඝ කාලයක් මේ තනතුර දැරුවේ ය. අවසානයේ ඔහු 1987 දී සිව්වන වරට ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සභාපති ලෙස නැවත පත් කර ඇත.

1987. 10. 29 දින සිට 1988. 12. 30 තෙක් කාලයේ ඩී. එච්. අබේසිංහ (සභාපති) ලෙස කටයුතු කරන සමයේ එහි සාමාජිකයන් ලෙස පී. පෙරියනායගම්, චන්ද්‍රසේන ගුණවර්ධන, ඩග්ලස් වික්‍රමසිංහ, අලයිමා කාදර්, මොරිස් දහනායක, ඇල්ෆ්‍රෙඩා ඩි. සිල්වා, එම්. සී. එම්. ඉක්බාල්, බන්දුල ජයවර්ධන, මහාචාර්ය ජේ. බී. දිසානායක, ඕ. ශ්‍රීමා ද සිල්වා, ධර්ම ගුණසිංහ, පුන්‍යකාන්ති විජේනායක, ආර්. එල් විමලධර්ම, ඩී. ජී. එඩ්වින් ද සිල්වා, එන්. කෝදාගොඩ, මානෙල් රත්නායක, ඊශ්වරී කොරයා, ඩී. විජේවර්ධන හා ටී. ලදාවනෙත්ති කටයුතු කරන ලදී. ඊට අමතරව ජාතික බුද්ධි කාර්යාංශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ආදී ආයතනවල නියෝජනයක්ද විය.

'අපේ වැඩේ චිත්‍රපට තහනම් කරන එකවත් ඒ අයට අකුල් හෙළන එකවත් නෙමෙයි. අපි බලන්නෙ ඒ අය හදන චිත්‍රපට නිසා පොදුවේ

සමාජයට හානියක් වෙනවද කියන එකයි. විශේෂයෙන් සිංහල සංස්කෘතියත්, ළමා මනසත් රැක ගැනීම මේ මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වෙලා තියෙනවා.' යනුවෙන් අබේසිංහ අදහස් දක්වා ඇත. (සිළුමිණ /1980 නොවැම්බර් 23)

1980 දශකයේ කලාත්මක අගයෙන් මෙන් ම සමාජමය වටිනාකමෙන් ද ඉහළ අගයක් ගත් චිත්‍රපට පහක් නෛතික හා නෛතික නොවන රාමු තුළ සිට වාරණය වීම කැපී පෙනේ.

| | |
|---|---|
| සොල්දාදු උන්නැහේ | ධර්මසේන පතිරාජ |
| සතර පෙර නිමිති | සුනිල් ආරියරත්න |
| ක්‍රිස්තු චරිතය | සුනිල් ආරියරත්න |
| සාගරයක් මැද | ගාමිණී ෆොන්සේකා |
| සත්‍යග්‍රහණය | ඩී. බී. වර්ණසිරි |

### සොල්දාදු උන්නැහේ චිත්‍රපටය

ධර්මසේන පතිරාජ විසින් 1981 දී සොල්දාදු උන්නැහේ චිත්‍රපටය නිර්මාණය කරන ලදී. 'පරණ සොල්දාදුවා' කෙටිකතාව පාදක කොට ගෙන නිර්මාණය වූ සොල්දාදු උන්නැහේ චිත්‍රපටයට 1953 හර්තාලය වෙනුවට දෙවන ලෝක සංග්‍රාමය පාදක කොට ගන්නේ රූගත පාලක මණ්ඩල වාරණයට හසුවීම වළක්වා ගැනීමට ය.

දේශපාලනමය වශයෙන් ගත් විට පතිරාජගේ වඩාත් ම ගැඹුරු හා සංකීර්ණ සිනමා කෘතිය ලෙස 'සොල්දාදු උන්නැහේ' හඳුන්වා දිය හැකි ය. මේ තුළින් ඔහු විමසා බලනු ලබන්නේ නිදහස හා පරමාධිපත්‍යය පිළිබඳ ව යි. පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇති ය යන්න සම්මත පිළිගැනීම වුවත් එසේ නොවන චරිත හතරක් හා ඔවුන් ජීවත්වන දින තුනක් පසුබිම් කර ගෙන ගොඩනගන කතා පුවත චිත්‍රපටයේ දිගහැරේ.

චිත්‍රපටයේ කේන්ද්‍රීය චරිත හතර වන්නේ මනෝ විකෘතියට පත් පරණ සොල්දාදුවෙක්, මහ මඟට වැටුණු කන්තෝරුකාරයෙක්, ගණිකාවක් හා ගැටකපන්නෙකි. මේ චරිත හතර ම නිෂ්පාදන ක්‍රියාවලියෙන් වියුක්ත අයවීම විශේෂත්වයකි. ඔවුන් පවතින කාලකණ්ණි සමාජ ක්‍රමය මඟින් නන්නත්තාරයන්, පාදඩයන් කරනු ලැබූවන් ය. 'සොල්දාදු උන්නැහේ' චිත්‍රපටයෙන් දැක්වෙන්නේ මේ චරිත හතර නිදහස් දින, ඊට පෙර හා පසු

දින යන දින තුනේ දී ගත කරන ජීවිතය යි. මේ දින තුන ම මුළුමනින් ම සංකේතානුරූපී ය. මේ චිත්‍රපටය චිත්‍රපට සංස්ථාවේ 100%ක ණය ආධාර ක්‍රමය යටතේ නිෂ්පාදනය වූවකි.

මේ චිත්‍රපටය රජය විසින් හෝ රූගුම් පාලක මණ්ඩලය විසින් වාරණය කරන ලද්දක් නොවන අතර එය සිනමාකරු විසින් ම ස්වයං වාරණය කර තිබේ. එච්. ඒ. සෙනෙවිරත්න ගේ 'පරණ සොල්දාදුවා'කෙටිකතාව පදනම් කරගත්ත ද ඔහු එම කතාව සම්පූර්ණයෙන් ම චිත්‍රපටයට නැගුවේ නැත. එච්. ඒ. සෙනෙවිරත්නගේ කෙටි කතාවේ සොල්දාදුවා මනෝ විකෘතිභාවයට පත් වන්නේ හර්තාලයේ කම්කරුවන්ට වෙඩි තැබීමෙන් ලත් අත්දැකීම්වලිනි. නමුත් ධර්මසේන පතිරාජ එය දෙවැනි ලෝක මහා යුද්ධයට සංශෝධනය කරන්නේ මෙරට පවත්නා වාරණ ප්‍රශ්න හේතු කොට ගෙන ය. එවැනි තත්ත්වයක් චිත්‍රපටය තුළ නිරූපණය කළේ නම් මෙම චිත්‍රපටය නියත වශයෙන් ම රජය හෝ රූගුම් පාලක මණ්ඩලය විසින් වාරණය කරනු ලබන බව සිනමාකරුගේ විශ්වාසය වී තිබූ බව ඔහු මේ පිළිබඳ ව දක්වා ඇති අදහස්වලින් පෙනේ. ඔහුගේ මීට පෙර නිර්මාණය කරන ලද 'බඹරු ඇවිත්' චිත්‍රපටය ද වාරණයට ලක් වූ බැවින් මෙම චිත්‍රපටය ද වාරණයට ලක්වේ යැයි පූර්ව විනිශ්චය මෙම ස්වයං වාරණයට පසුබිම සකස් කළා විය හැක. නිදසුනක් ලෙස ඔහු මේ චිත්‍රපටය සම්බන්ධයෙන් සත්සර පුවත්පතේ 1981 අප්‍රේල් 16 දින කලාපයේ මෙසේ අදහස් දක්වා තිබේ.

'මෙම කෙටිකතාවේ යුද්ධ පසුබිමක් ඇත්තේ ම නැත. එයට පසුබිම් වී තිබුණේ 1953 හර්තාලය යි. එබඳු දෙයක් ගැන අපේ සිනමාවේ පසුබිම කර ගන්නට පවතින දේශපාලන වාතාවරණයේ වාරණ මණ්ඩලයෙන් ඉඩ දෙන්නේ නැත.'

මෙසේ පතිරාජ විසින් නිර්මාණය කරන ලද 'සොල්දාදු උන්නැහේ' චිත්‍රපටය මෙ වැනි දුෂ්කරතා මැද 1981 අප්‍රේල් 10 වෙනි දින තිරගත වූ අතර එය 1980 දශකයේ තිරගත වූ විශිෂ්ටතම සිනමා කෘතිය ලෙස සම්මානයට ද පාත්‍ර විය.

## සතර පෙර නිමිති චිත්‍රපටය

ප්‍රසිද්ධ රූගුම් පාලක මණ්ඩලය විසින් තහනම් කරන ලද 'සතර පෙර නිමිති' චිත්‍රපටය රාජ්‍ය චිත්‍රපට සංස්ථාවේ තිරනාටක ඇගයීමේ කමිටුව

විසින් බැංකු ණය සහිත ව 1978 වසරේ දී අනුමත කළ පිටපතකින් සැදුම් ලද්දකි. මේ සම්බන්ධයෙන් විවිධ මතභේද ඇති වූ අතර 1980 ඔක්තෝබර් 24 වෙනි දින ආරාධිත ප්‍රේක්ෂක පිරිසකට ටවර් රඟහලේ දී තිරගත කරන ලදී.

සතර පෙර නිමිති චිත්‍රපටය සඳහා තේමාව වී ඇත්තේ අනුන්ගේ මෙහෙයවීම මත පැවිදි බව ලබන හිමි නමක් තරුණ වියට පා තබත් ම තමාට මුණ ගැසෙන භෞතික ලෝකය දෙස මහත් ආශාවකින් බලා පසුව එම ආසක්ත බව මැඩගෙන නැවත නිසල ජීවිතයක් වෙත යොමු වීම යි. මිනිස් සිතෙහි ප්‍රබල ආවේගයක් සේ සැලකෙන රාගය හේතුවෙන් සිතින් කැළඹෙන තරුණ භික්ෂුවකගේ එම චෛතසික හැලහැප්පීම් නිසා සිදු වන ඛේදවාචකයක් සතර පෙර නිමිති චිත්‍රපටයෙන් නිරූපිත ය.

සරසවි භූමියක භික්ෂූන් වහන්සේ නමක් හා ශිෂ්‍යාවක් අතර ඇතිවන ප්‍රේම සබඳතාවය නිසා මෙය බෞද්ධයින්ට නොගැලපෙන බවට බෞද්ධ නායකයින් දැඩි ලෙස විරුද්ධ වීම හේතු කරගෙන සතර පෙර නිමිති චිත්‍රපටය වාරණය විය. නමුත් බෞද්ධ තේමාවන් මූලික කරගෙන චිත්‍රපට මෙතෙක් නිෂ්පාදනය වී තිබුණ ද කාලීන සමාජයට ගැළපෙන මාතෘකාවක් ඔස්සේ තැනූ සාර්ථක නිර්මාණයක් ලෙසින් ද සතර පෙර නිමිති දුටු ප්‍රේක්ෂකයෝ සිටියහ.

### වාරණයේ දී ඉවත් කළ කොටස්

සතර පෙර නිමිති චිත්‍රපටිය වාරණය වූයේ බෞද්ධ සමාජයට නිගරු වන ලෙස සුදත්ත හිමිගේ චරිතය නිරූපණය වීමෙන් බව බෞද්ධ භික්ෂූන් විසින් ප්‍රකාශ කර තිබුණි. නමුත් සුදත්ත හිමි හා අනෝමා අතර පෙම් සබඳතාවයේ දී සාමාන්‍ය පිරිමි, ගැහැනු දෙදෙනකු අතර වන සිදුවීම් සිවුරු පොරවා සිටීමේ දී සිදු නොවුණි. අතින් අල්ලන සිද්ධිය, සරසවිය තුළ දී හමු වී කතාබහ කිරීම ආදී ඉතා ම සුළු සිද්ධීන් කිහිපයක් නිසා චිත්‍රපටය වාරණයට ලක් කර ඇත. නමුත් තිරකතා ඇගයීම් කමිටුව විසින් චිත්‍රපටය අනුමත කර තිබුණි.

බෞද්ධ භික්ෂුවකගේ පෙම් ජවනිකා ඇතුළත් වීම නිසාත්, ප්‍රධාන වශයෙන් ම බෞද්ධ නායකයින්ගේ විරෝධයට ලක් වීමත් වාරණයට මූල බීජය විය. නමුත් බෙහෝ සෙයින් ම වාරණයට බලපාන ලද්දේ

සැකයකි. බෞද්ධ ගිහි පැවිදි දෙපිරිස අතර මෙම චිත්‍රපටය හරහා කළකිරීමක් පිළිකුලක්, කැළඹීමක් හටගනීවි යන ප්‍රශ්නය වාරණයට ප්‍රධානතම හේතු ව විය.

## ක්‍රිස්තු චරිතය චිත්‍රපටය

ක්‍රිස්තු චරිතය චිත්‍රපටය 1981 දී රූපගත කිරීම් ආරම්භ කරන ලදී. එය 1983 මාර්තු 23 දින කැබිනට් මණ්ඩල තීරණයක් අනුව තහනමට ලක් විය. එම චිත්‍රපටයට එරෙහි ව ක්‍රියාත්මක වූ ආගමික දේශපාලන බලපෑම් වල සංකීර්ණ එකමුතුවක් පෙන්නුම් කරයි.

මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ සිනමා කෘතියක් වන 'ක්‍රිස්තු චරිතය' ලෝක සිනමාව තුළ ක්‍රිස්තු චරිතය පදනම් කර ගත් 57 වැනි චිත්‍රපටය වන අතර අන් සියල්ල ම ඇමරිකාව, ජර්මනිය, ඉතාලිය, ප්‍රංශය ආදී රටවල් ආශ්‍රිත ව නිෂ්පාදනය කරන ලද නිර්මාණයන් ය. ඇලරික් ලයනල් ප්‍රනාන්දු ගේ යෝජනාවක් මත මහාචාර්ය සුනිල් ආරියරත්න ගේ අධ්‍යක්‍ෂණයෙන් විජය කුමාරතුංග ක්‍රිස්තු චරිතය රඟපෑ චිත්‍රපටයේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකි වන අන්දමේ විවිධ බාධා කිරීම් මුල පටන් ම එල්ල වූ අතර අවසානයේ ඉහත දැක්වූ ලෙසින් 1983 මාර්තු 23 දින ක්‍රිස්තු චරිතය චිත්‍රපටය තහනමට ලක් විය.

ආගමික චිත්‍රපටවල දී සාමාන්‍යයෙන් රැගුම් පාලක මණ්ඩලය විසින් ආගම්වලට අපහාස වෙනවාද සිත් රිදීම් වෙනවාද යනුවෙන් බැලීම සාමාන්‍ය දෙයකි. නමුත් චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමේ දී වාරණය කිරීමක් ලංකාවේ නොපැවතුණු අතර අධ්‍යක්‍ෂ සුනිල් ආරියරත්න පවසන්නේ මෙය රූගත කිරීම් කරන අතරතුර වාරණයට ලක් වූ මුල්ම සිංහල චිත්‍රපටය බව යි.

ක්‍රිස්තු චරිතය චිත්‍රපටය රූගත කිරීම ආරම්භ වීමත් සමඟ එල්ල වූ විරෝධතා ව්‍යාපාරය තුළ බලවේග තුනක් ක්‍රියාත්මක වූ බැව් අර්නස්ට් පෝරුතොට පියතුමා සඳහන් කරයි. එනම්

1. ක්‍රිස්තු චරිතය චිත්‍රපටයේ නොමිලේ පවා රඟපාන්නට ඉදිරිපත් වී ඒ සඳහා අවස්ථාව නොලද නළුනිළියෝ

2. පාස්කු සංදර්ශනවලින් (හලාවත පාස්කු) නළු නිළියන් තෝරා ගැනීම නිසා උරණ වූ පිරිස
3. දේශපාලනය

මේ කාලය තුළ ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව මඟින් ක්‍රිස්තු චරිතය චිත්‍රපටය සඳහා කමිටුවක් පත් කළ අතර එම කමිටුව නියෝජනය කළේ අම්පිටිය දෙව්සත්හලේ බයිබල් විශාරදයින් වන මහාචාර්ය ඩඩ්ලි පෙරේරා, මහාචාර්ය හෙන්රි සිල්වා, සී. ලෙස්ලි ප්‍රනාන්දු පියනම හා මැල්කම් රංජිත් පියනමත් ය. මෙම කමිටුව පත් කිරීමේ දී දක්වා තිබුණේ ඔවුන් චිත්‍රපටයේ සිනමාරූපීත්වය පිළිබඳ ඇගයුමක නොයෙදෙන අතර චිත්‍රපටයෙන් ඉදිරිපත් කෙරෙන ධර්මය, චරිත හා සිද්ධි තුළින් ක්‍රිස්තු භක්තියට හානියක් සිදු නොවන ලෙසින් වග බලා ගැනීම සිදු කරන බව යි.

ඒ අනුව මෙම කතෝලික රදගුරු මණ්ඩලය විසින් අධ්‍යක්ෂ වෙත පහත කොන්දේසි පනවා ඇත.

1. චිත්‍රපටයේ තිර නාටකය කතෝලික ධර්මය පිළිබඳ විශාරදවරුන් ලවා අනුමත කරවා ගත යුතු ය.
2. ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානයට චිත්‍රපටයේ විශේෂ ස්ථානයක් දිය යුතු ය.
3. ආගමික චරිත අපකීර්තියට පත් නොකෙරෙන පරිදි නළු නිළියන් තෝරා ගත යුතු ය.
4. නිෂ්පාදන කටයුතුවල දී විශේෂ පූජක කමිටුව සමඟ සම්බන්ධය නිරන්තරව පවත්වා ගත යුතු ය.

මේ අතර සුනිල් ආරියරත්න පවසන්නේ බෞද්ධයකු වන ඔහුට මේ චිත්‍රපටයේ විශාල වගකීමක් පැවරී තිබුණු බව යි. එනිසා එම කමිටුව විශාල අත්වැලක් ලෙස සැලකූ අතර එනිසා තිරනාටකයේ පිටපත් හතරක් සංශෝධනය පිණිස කමිටුවට ඉදිරිපත් කළ බව ද ඔහු සඳහන් කරයි. එමෙන් ම පිටපත පිළිබඳ ව කමිටුව විසින් ප්‍රධාන දුර්වලතා දෙකක් පමණක් ඉදිරිපත් කර ඇත. එනම්, ප්‍රාතිහාර්යයන් ක්‍රමවත් ව ඉදිරිපත් කොට නොමැතිකම හා මරණින් පසු උත්ථානය පිළිබඳ ජවනිකා ප්‍රමාණවත් නොවීම යන කරුණ යි. මෙම දුර්වලතා සංශෝධනය කර

චිත්‍රපටය නිපදවන්නට අධ්‍යක්ෂඑකඟත්වයට එළැඹ ඇති අතර කමිටුව නිෂ්පාදක හා අධ්‍යක්ෂ වෙත තවත් කොන්දේසි කිහිපයක් 1982 සැප්තැම්බර් 13 දින ඉදිරිපත් කර ඇත. එනම්, රූගත කළ කොටස් සංස්කරණය කොට කමිටුවට ප්‍රදර්ශනය කරන ලෙසත් ඉදිරි රූගත කිරීම්වලදී වරින් වර ඒ ඒ ජවනිකා පිළිබඳ සාකච්ඡා කිරීමත් ඒ අතර ප්‍රධාන වේ.

මේ සියලු කොන්දේසි යටතේ ක්‍රියා කරන අතර දී දේශපාලන වශයෙන් එල්ල වූ එදිරිවාදිකම් වඩා බලවත් විය. ක්‍රිස්තු චරිතය එවකට ප්‍රබල විපක්ෂ දේශපාලන ප්‍රතිරූපයක් ගොඩනගාගෙන තිබූ විජය කුමාරතුංග විසින් රඟපෑම බොහෝ දේශපාලන ක්‍රියාකාරීන්ට දරාගත නොහැකි සිදුවීමක් වී ඇත.

එකල හලාවත, වෙන්නප්පුව, කටුනේරිය ආදී මුහුදුබඩ කතෝලික ප්‍රදේශවල බලය දේශපාලනික වශයෙන් නතු කර ගෙන තිබුණේ එකල බලයේ පැවති එක්සත් ජාතික පක්ෂය යි. මෙහි දී විජය කුමාරතුංග දේශපාලනඥයකු ලෙස මහජන පක්ෂය ගොඩනගමින් සිටි අවධිය නිසා බොහෝ දෙනෙක් ඔහුගේ ජනප්‍රියත්වය දේශපාලනයට බලපානු ඇතැයි බිය වූවා විය හැක. විශේෂයෙන් ඉන්දියාව තුළත් එම්. ජී. රාමචන්ද්‍රන්, ජයලලිතා වැනි අය එරට දේශපාලන බලය, චිත්‍රපට වීරයා වීම තුළින් ජනතාවගේ හද දිනාගෙන සිටීම නිසා මෙරට සිටි දේශපාලනඥයන් ද ඊට බිය වූවා විය හැක. කෙසේ හෝ මේ අයුරින් විජය කුමාරතුංගට විරුද්ධ ව දේශපාලනික වශයෙන් විශාල ගැටලුවක් පැවතුණි. නමුත් මේ සියලු කාරණා ඉස්මතු වීමට බලපෑවේ චරිතවත් නළුවෙකු විසින් ක්‍රිස්තු චරිතය රඟපෑ යුතුය යන්න රෝමානු කතෝලික පල්ලිය මඟින් නැගූ තර්කය වේ. එමෙන්ම රදගුරු කමිටුව තුළින් ඉදිරිපත් වූ කොන්දේසි අතර ද මෙම කරුණ අන්තර්ගත වී ඇත.

ලෝක සිනමාව තුළ ක්‍රිස්තුස් වහන්සේගේ චරිතය නිරූපණය කළ අය තෝරාගෙන ඇත්තේ ඔවුන්ගේ චරිතවත් බව සොයා බලා නොවේ. අපරදිග නිෂ්පාදිත එක් චිත්‍රපටයක කන්‍යා මරියතුමියගේ චරිතය නිරූපණය කළේ දෙවරක් දික්කසාද වූ ගැහැනියකි. මසුන් මරන්නන් පාස්කු සමයේ දී රැවුල්, කොණ්ඩා, ලෝගු හැඳ ක්‍රිස්තු චරිතය නිරූපණය කරති. අප අගය කළ යුත්තේ ඔවුන්ගේ කැප කිරීම යි. ඔවුන්ගේ රංග කුසලතාව මිස පෞද්ගලිකත්වය නොවන බව චිත්‍රපටයට පක්ෂ ව ඉදිරිපත් වූ අදහස යි.

අර්නස්ට් පෝරුතොට පියතුමා පවසන ආකාරයට මෙම චිත්‍රපටයට කතෝලික සභාව අත නොගැසිය යුතු අතර චිත්‍රපටයට උපදෙස් අවශ්‍ය නම් ඒ පිළිබඳ විශාරදයන්ගේ සහාය ලබා දිය යුතු නමුත් නළු නිළියන් නම් කිරීම කතෝලික සභාවට අයත් කාර්යයක් නොවේ.

1982 නොවැම්බර් 20 දින රූපගත කළ කොටස් තමන්ට නොපෙන්වීමත්, උපදෙස් ලබා ගැනීම පිළිබඳ උනන්දුවක් නොදක්වීමත් හා අධ්‍යක්ෂ හා නිෂ්පාදක විසින් මුරණ්ඩු ලෙස චිත්‍රපටය නිර්මාණය කිරීමත් යන හේතු දක්වමින් රදගුරු මණ්ඩලය ඉල්ලා අස්විය. අවසාන ප්‍රතිඵලය වූයේ කැබිනට් තීරණයක් මඟින් 1983 මාර්තු 23 දින ක්‍රිස්තු චරිතයේ වැඩ කටයුතු නතර කර දමන ලදී.

කතෝලික සභාව හා අතලොස්සක් පමණ වූ ජන කොට්ඨාසයක බලපෑම් හා උද්ඝෝෂණ නිසා එම චිත්‍රපටය පිළිබඳ ප්‍රශ්නය රදගුරු මැදුර හරහා පාර්ලිමේන්තුව දක්වා ම පැතිර යන්නට වීම තුළින් ක්‍රිස්තු චරිතය නිෂ්පාදනය කිරීමට එරෙහිව රජය මඟින් පියවර ගන්නා බව ඇතැම් පුවත්පත් වාර්තා කොට තිබුණ ද එවැන්නක් ලිඛිත ව එම චිත්‍රපටයේ අධ්‍යක්ෂවරයා ට හෝ නිෂ්පාදකවරයා ට දන්වා තිබුණේ නැත.

මේ අයුරින් දස වසරක් පමණ වූ නිෂ්පාදනයක් අවසානයේ 1990. 10. 09 දින සියලුම කතෝලික, බෞද්ධ, මුස්ලිම්, හින්දු ආදී ආගම් අදහන ප්‍රේක්ෂකයින්ට ක්‍රිස්තු චරිතය චිත්‍රපටය නැරඹීමේ අවස්ථාව උදා විය. ක්‍රිස්තු චරිතය වූ කලී නිෂ්පාදන අවස්ථාවේ තහනම් වූ පළමු චිත්‍රපටය වේ.

## සාගරයක් මැද චිත්‍රපටය

ගාමිණී ෆොන්සේකා අධ්‍යක්ෂණය කරමින් රංගනයෙන් ද දායක වූ 'සාගරයක් මැද' චිත්‍රපටය මහජන ප්‍රදර්ශනයට ඉඩ නොදී තහනමට ලක් වූ අතර මෙම චිත්‍රපටය තමාගේ පෞද්ගලික ජීවිතයට අපහාසයක් සිදු වී ඇති බැවින් ඒ වෙනුවට රුපියල් දශ ලක්ෂයක වන්දියක් ලබා දෙන ලෙස ඉල්ලා හිටපු මුදල් හා අධිකරණ ඇමතිවරයකු වූ ෆීලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක විසින් කොළඹ දිසා අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කෙරුණි. මේ හේතුවෙන් චිත්‍රපටය මහජන ප්‍රදර්ශනය සඳහා නිකුත් කිරීමට සෑහෙන කාලයක් ගත විය.

'සාගරයක් මැද' සිනමා කෘතිය වාරණයට ලක්වීම සම්බන්ධයෙන් එහි අධ්‍යක්ෂවරයා වූ ගාමිණී ෆොන්සේකා මහතා 1981. 03. 22 දින සරසවිය පුවත්පතට දක්වූ අදහස් පහත දක්වෙයි.

'සාගරයක් මැද' අනාගතයේ හෝ අතීතයේ හෝ සිදුවීම් වටා ගෙතුනක්. මෙයින් කියැවෙන්නේ සනාතන අරගලයක් ගැන යි. කිසියම් පුද්ගලයකුට හෝ සංවිධානයකට මහජන බලතල ඕනෑවට වඩා පැවරීමෙන් පසු සිදු වෙන හා සිදු වීමට පුළුවන් කතා පුවතක් තමයි මගේ චිත්‍රපටයේ කියන්නේ. කලකට පෙර පුවත්පත්වලින් අනාවරණය වන ඇතැම් අයථා ක්‍රියා මා අලුතින් මැවූවක් නොවේ. මෙරට සිදු වූ ඇතැම් සිදුවීම් ඒ ආකාරයෙන් ම වාර්තා කිරීමට ගත් උත්සාහයක් නොවේ. 'සාගරයක් මැද' චිත්‍රපට කලාකරුවා හුදෙක් වාර්තාකරුවෙක් නොවේ. ඔහු පවතින සමාජ සිද්ධීන් ඇසුරු කොට නිර්මාණයක් අපූර්වත්වයෙන් ඉදිරිපත් කරයි. නිර්මාණයත්, වාර්තාවත් අතර ඇත්තේ පරස්පර විරෝධී ක්‍රියාදාමයක්. එබැවින් සාගරයක් මැද තුළින් මා උත්සාහ ගත්තේ මෙරට සිදු වූ සත්‍ය දේ තුළින් වෘත්තාන්තයක් ගොඩනැගීම පමණයි. මේ සඳහා මට නිදහසක් නැද්ද? සෙසු කලා මාධ්‍යවලට ඇති නිදහස සිනමා කලාකරුවාට නැද්ද? චිත්‍රපට පසුබිම් පරිසරය අතීතය විසින් සාදා තිබුණා. ඉතින් එවැනි සිද්ධීන් විශේෂයෙන් සමාජ විරෝධතාව තේමා කොට චිත්‍රපට නිර්මාණය කිරීමට බැරිද? සත්තකින් ම තුන්වැනි ලෝකයේ චිත්‍රපට කලාකාරුවාගේ අභිප්‍රාය විය යුත්තේ යථාර්ථය ඇති සැටියෙන් විග්‍රහ කිරීම නොවේ ද? චිත්‍රපට ප්‍රේක්ෂකයාගේ ඇස්වලට වැලි ගැසූ කාලය දැන් අවසන් වී තිබෙනවා. දැන් ඔවුනට අවශ්‍ය යථාර්ථය පමණයි. අතීත සිදුවීම් තුළින් සත්‍ය සිදුවීම් තුළින් නිර්මාණයන් කිරීම දෙස වපර ඇසින් බලන්නේ ඇයි? අද පවතින ප්‍රජාතන්ත්‍රවාදී සමාජයේ මූලික පදනම විවේචනය කිරීමේ නිදහස සෙසු කලා මාධ්‍යවලට මෙන් ම සිනමාකරුවාට පමණක් නැත්තේ මන්ද? මා මේ චිත්‍රපට තුළින් කිසිවකුටත් මඩ ගැසීමට හෝ උපහාසයක් කිරීමට උත්සාහ කළේ නැත. බලය නොනිසි ලෙස පාවිච්චි කිරීමෙන් සමාජයත්, ජනතාවත් පෙළෙන බව මාගේ චිත්‍රපටය යටින් සිහින් නූලක් මෙන් යන තේමාව ය. මෙහි එන විවිධ චරිත කළු, සුදු ලෙස හංවඩු ගැසීමට නොව ඒවා දෙස දයානුකම්පාවෙන් බැලීමට මා උත්සාහ ගත්තා. මේ චිත්‍රපටය පමණක් නොව එහි එන චරිත දෙස ම මා බැලුවේ ඉහවහා ගිය මානව දයාවකිනි'. (සරසවිය -1981. 03. 22)

සාගරයක් මැද චිත්‍රපටය මණ්ඩලය මගින් තුන් වතාවක් බලා කිසිදු තීරණයක් නොලැබූ චිත්‍රපටයක් ලෙස නම් කළ හැකි ය. 1980 මැයි 08 වැනිදා මේ චිත්‍රපටය ජනාධිපතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය මගින් නැරඹීමට රජයේ චිත්‍රපට ආයතනය සූදානම් ව සිටිය ද හිටපු අධිකරණ ඇමති ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකගේ පැමිණිල්ල අනුව මේ චිත්‍රපටයේ මහජන ප්‍රදර්ශනය තහනම් කෙරිණි. එම අධිකරණ නියෝගයට අනුව ජනාධිපතිතුමාත් කැබිනට් මණ්ඩලයත් 'සාගරයක් මැද' නොබැලීමට තීරණය කළහ. එතැන් සිට මාස 8ක කාලයක් තිස්සේ නඩු කියනු ලැබීය. මේ චිත්‍රපටය මහජන ප්‍රදර්ශනයටවත් නොතබා මේ තමාගේ චරිත යයි පූර්ව නිගමනයකට බැසීමට කිසිවකුට බැරිය යන පදනම මත අවසානයේ මේ චිත්‍රපටය සඳහා පනවා තිබූ තහනම් නියෝගය නිෂ්ප්‍රභ කරනු ලැබීය.

නමුත් ගාමිණී ෆොන්සේකාගේ 'සාගරයක් මැද' චිත්‍රපටය සම්බන්ධ අවසන් තීරණය එවක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන සමඟ නැරඹීමෙන් පසු ගැනීම තුළ චිත්‍රපටයක් වාරණයට රාජ්‍ය මැදිහත්වීම පෙන්නුම් කරයි.

## සත්‍යග්‍රහණය චිත්‍රපටය

ඩී. බී. වර්ණසිරි අධ්‍යක්ෂණය කළ 'සත්‍යග්‍රහණය' චිත්‍රපටයක අන්තර්ගතය නිෂ්පාදකගේ බලපෑමට හසුවීම පිළිබඳ නිදසුනකි. චිත්‍රපටයේ නිෂ්පාදක ලෙස පෙනී සිටියේ ශේෂා පලිහක්කාර වුවත් එහි සැබෑ නිෂ්පාදක වූයේ එවක අමාත්‍යවරයකු වූ ගාමිණී දිසානායක හා ආචාර්ය වික්‍රම වීරසූරිය ඇතුළු පිරිසකි.

1974 දවස පුවත්පත් ආයතනයට සීල් තැබීම හා ඊට සම්බන්ධ පුවත්පත් කලාවේදියකුගේ චරිතය චිත්‍රපටයේ තේමාව විය. චිත්‍රපටය නිෂ්-පාදනය කරන්නේ දේශපාලන වශයෙන් සමගි පෙරමුණු රජයට එරෙහි ව ය. එහෙත් චිත්‍රපටය ප්‍රදර්ශනය වන කාලය වන විට (1987. 03. 13) එ. ජා. ප. රජයත් ඒ හා සමාන ජනමාධ්‍ය වාරණයට හා සීල් තැබීම්වලට යොමු වී සිටි බැවින් චිත්‍රපටයේ තේමාව බලයේ සිටි පක්ෂයට අභියෝගයක් විය. එබැවින් චිත්‍රපටය නොසලකා හැරීමට අධ්‍යක්ෂවරයාට සිදු විය.

## සමාලෝචනය

චිත්‍රපට මාධ්‍යය වාරණය අතින් ගෙන උපන් මාධ්‍යයකි. රැගුම් පාලක මණ්ඩලයක් යටතේ චිත්‍රපට මාධ්‍යය නියාමනය කිරීම ලෝකයේ පිළිගත් විධි ක්‍රමය ය. වෙනස පවතිනුයේ භාවිත කරන විධි ක්‍රමයේ ය.

80 දශකයේ ලාංකික සිනමාව වාරණය සම්බන්ධයෙන් දේශපාලඥයන් හා රජය වෙත චෝදනා එල්ල වුව ද චිත්‍රපටයක තේමාව තෝරා ගැනීම, තිර රචනය, රූපගත කරන අවස්ථාවේ සිට ලාංකික දේශපාලන, සංස්කෘතික හා ආර්ථික කරුණු නිර්මාණාත්මක චින්තනය වෙත බලපෑම් කරයි. එය ස්වයං වාරණයකි.

පොදුවේ පිළිගත් රැගුම් පාලක මණ්ඩල ප්‍රතිපත්තියක් පැවතියද එය එක් එක් පුද්ගලයාට හා සමාජයන්ට සාපේක්ෂ ව අර්ථනිරූපණය වී ඇත. රැගුම් පාලක මණ්ඩලය පත් කරනුයේ රජය විසිනි. බලයට පත්වන පක්ෂයේ මතවාදය සෘජු ව හෝ අනියම් ව නියෝජනය කිරීමක් රැගුම් පාලක මණ්ඩලය ක්‍රියාත්මක වීමේ දී දැකිය හැකි ය. රැගුම් පාලක මණ්ඩල සභාපති හා සාමාජිකයන් පත් කිරීමේ ක්‍රමවේදය විමසීමෙන් මෙය තහවුරු වේ. පවතින රජයට පක්ෂපාතී වීම, ඒ මතය ක්‍රියාත්මක කිරීම යන්නට නිදසුන් රැසකි. ගාමිණී ෆොන්සේකාගේ 'සාගරයක් මැද' චිත්‍රපටය සම්බන්ධ අවසන් තීරණය එවක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන සමග නැරඹීමෙන් පසු ගැනීම නිදසුනකි.

චිත්‍රපටයක් සමාජගත වීම නුසුදුසු යැයි තීරණය කළ යුත්තේ චිත්‍රපටයේ තේමාව, රූප රාමු වල ස්වභාවය, රඟපෑමේ දී හැඟීම් නිරූපණය කෙරෙන ආකාරය, ඉදිරිපත් කෙරෙන සිදුවීම් හා රූප රාමු අපේ සමාජයට හා සදාචාරයට බද්ධ වන ආකාරය, හඬපටය, දෙබස්වලින් හා එහි ඉංග්‍රීසි උපසිරැසිවලින් සැපයෙන අදහස්, පෙර හා පසු සිදුවීම් සංස්කරණය ආදී වශයෙන් සමස්ත නිර්මාණය පුළුල් දෘෂ්ටියක සිට සලකා බැලීමෙනි. ක්‍රිස්තු චරිතය චිත්‍රපටය වාරණය වන්නේ එය නිෂ්පාදනය කරන අවස්ථාවේ දී ම ය. එයට ආගමික හා දේශපාලනික කරුණු සෘජු ව බලපා ඇති බව පැහැදිලිය.

ඒ අනුව චිත්‍රපට වාරණය සම්බන්ධ පහත නිරීක්ෂණ ඉදිරිපත් කළ හැකිය.

- චිත්‍රපටයක් තුළ සෞන්දර්යාත්මක වාරණයන් ක්‍රියාත්මක වීම වැළැක්විය නොහැක.
- වාරණය තුළ අන්තර්ගත සැඟවුණු න්‍යාය පත්‍රයක් පවතියි.
- එය විවිධ දේශපාලන හා පුද්ගල උවමනාවන් උදෙසා භාවිත කරයි.
- වාරණය නිර්මාණකරුගේ පරිකල්පනය සීමා කරයි.
- රැඟුම් පාලක මණ්ඩලය චිත්‍රපට පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී එයට දේශපාලනික දෘෂ්ටිය බලපායි, රාජ්‍ය ප්‍රතිපත්තිය දැන සිටිය යුතු යි, පත් කරන රජයට වග කියයි, ඔවුන්ගේ පෞද්ගලික දෘෂ්ටිය සහ ආගමික හා සංස්කෘතික දෘෂ්ටිය බලපායි.

### යෝජනා

- කලා කෘතියකට තහංචි පැනවීම සමාජයට විඥානධාරා සැපයෙන ප්‍රභවයන් මැඩ පැවැත්වීමකි. එබැවින් සිනමාවේ හෝ අනෙකුත් කලාවන්හි ප්‍රකාශන අයිතිය මෙන් ම ප්‍රේක්ෂක රස වින්දන අයිතිය තර්ජනයට ලක් කරන කවරාකාර හෝ අත්තනෝමතික තීරණයකට සංවිධානාත්මක ව එරෙහි විය යුතු ය.

- ලාංකික සිනමාකරුවන් හිතාමතා ම වැදගත් සහ සමාජ කේන්ද්‍රීය තේමා සඳහා ස්වයං වාරණයන් පනවා ගැනීමට රුකුල් දෙන පරිසරයක් නිර්මාණය වීම වැළැක්වීම සමාජීය මෙන් ම රාජ්‍ය වගකීමකි.

- රැඟුම් පාලක මණ්ඩලය නිර්මාණකරුවන් ස්වයං වාරණයකට පෙළඹවීම නොකළ යුතු ය.

- වාරණයට ලක් වූ හෝ මෙම වාරණයන්ට විරුද්ධ වන කලාකරුවන් අතර එකඟතාවක් තිබිය යුතු අතර සමාජය සංවිධානාත්මක ව එයට විරෝධය දැක්විය යුතු ය.

- විවිධ සමාජ පැතිකඩ දෙස නිර්මාණාත්මක දෘෂ්ටියකින් බලා එය ප්‍රතිනිර්මාණය කිරීමට සිනමාකරුවකුට නිදහස තිබිය යුතු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

- *ආරියදාස, එඩ්වින් (1985), සිනමා ලිපි, දිවැස ප්‍රකාශකයෝ, වැල්ලම්පිටිය.*
- *ආරියරත්න, සුනිල් (1990), ක්‍රිස්තු චරිතය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.*
- *ජයතිලක, අමරනාත් (1987), චිත්‍රපට රස වින්දන, ජාතික චිත්‍රපට සංස්ථාව, කොළඹ 07.*
- *නයනජිත්, නුවන් (2004), ගාමිණී, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ 10.*
- *නයනජිත්, නුවන් (2005), ශ්‍රී ලාංකේය සිනමා වංශය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.*
- *නිහාල්සිංහ, ඩී. බී. (2007), ලාංකික සිනමාවේ ස්වර්ණමය යුගය බිඳ වැටීම, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.*
- *පල්ලියගුරු, චන්ද්‍රසිරි (2006), සිංහල විශ්ව කෝෂයේ එකළොස්වන කාණ්ඩය, චිත්‍රපට.*
- *මහින්දපාල, එම්. ඩී. (2006), සිනමාව හා ජන සමාජය (පරිවර්තන), සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.*
- *Key Concepts in Cinema Studies - 2004 second Edition Hayward, Susan, First Indian Reprint*
- *1952 අංක 23 දරන ප්‍රසිද්ධ රැඟුම් පාලක ආඥා පනත*
- *මහාචාර්ය ඒ. ජේ. ගුණවර්ධන කමිටු වාර්තාව (1983)*

පුවත් පත්

- *සිළුමිණ පුවත්පත -. 1980 නොවැම්බර් 23*
- *සත්සර පුවත්පත - 1981 අප්‍රේල් 16*
- *සරසවිය පුවත්පත - 1981 මාර්තු 22*